# ළමයින්ගේ ලෝකය සුභාෂිතය 02

**පද්‍ය 100කින් සමන්විත සුභාෂිතය පද්‍ය 1 සිට 16 දක්වා පින් කිරීමට හා නිවන්පුරට යාම පිලිබඳ ප්‍රාර්ථනා කාව්‍ය සමුදායකි. පද්‍ය නිර්මාන අතර එදා මෙන් අදටත් විද්වතුන් අතර ප්‍රකට පරිශීලනය වන උපදේශ කායන 25ක් තෝරා කෙරෙව මෙම විග්‍රහයෙන් සුභාෂිතයේ අගය විමසා බලමු.**

### 17 වන පද්‍යය

**නැගෙතත් අවරගිරෙන් දිනකර මඬල**
**පිපෙතත් ගිරි මුදුන හෙල් මැලි පියමුසු**
**කලෙකත් සුනෙර පවනින් සලෙතත් අතල**
**බොරු නැත්තෙමය මහතුන් පැවසූ**

සඳ මඬල අපරදිගින් පර්වත මුදුනෙහි කුමුදු නෙළුම් මල් පිපුණත් සුළඟින් මහමෙර සෙලවුණත් ගින්නෙන් ජලය ලැබුනත් මහා උතුමන්ගේ වචන වල බොරු නැත්තේ ය.

### 19 වන පද්‍යය

**පින්මඳ පුතුන් සියයික් ලදුවත් නිසරු**
**ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු**
**එක පුන්සඳෙන් දුරුවෙයි ලොව ගණ අඳුරු**
**නෙක තරු රැසින් එලෙසට නොමවේය දුරු**

පින් අඩු පුතුන් සීයක් ලැබුණත් පළක් නැත. උතුම් වන්නේ රූණයෙන්ද නුවණින්ද බලයෙන්ද යුතු පුතුමය. ලෝකයේ ගණ අඳුර තරු රැසක එළියෙන් දුරු නොවුණද එක පුන්සඳ නිසා දුරුවන්නේ ය.

### 21 වන පද්‍යය

**කුළුණු ගුණින් යුතු උතුමන් සිත මහරු**
**දුදන බසින් නොයෙදෙයි කරනට නපුරු**
**නව රුවනින් පිරි මහ සමුදුර ගැඹුරු**
**තණ සුළකින් හුණු කළ හැකි වෙති කවුරු**

කරුණා ගුණයෙන් පිරි උතුමන්ගේ සිත් අසත්පුරුෂයින්ගේ වනවලින් නපුරු කිරීමට නොහැකිවෙයි. නවරත්නයන්ගෙන් පිරුණු මහසමුදුර තණ පන්දමකින් අණු කිරීමට කවුරු සමත් වෙත්ද?

### 25 වන පද්‍යය

**කුළුණින් ගුණෙන් නුවණින් පසිඳු හැමතැන**
**සුදනන් සෙවුන නිරිඳෝ ලෙව් සත රකින**
**දෙහිරුන් මලින් රොන්ගෙන යන මෙන් සෙමින**
**කියමින් අය ගනිති සත සිත නොතළ මින**

කරුණාවෙන්ද ගුණයෙන්ද නුවණින්ද ප්‍රකට සත්පුරුෂ රඩවරු මීමැස්සන් මල් නොතලා රොන්ගෙන යන්නාක් මෙන් ලෝක සත්වයා නොතලා අයබදු අය කරයි.

### 35 වන පද්‍යය

**නපුරු කලට සතහට පැමිණෙත වෙහෙස**
**දෙදුරු නොවෙයි කළ පවු පල දෙවා මිස**
**තඹුරු වනය මුකුලිත වන බව සවස**
**කවුරු විසින් වැළකිය හැකි මෙදිය කුස**

සවස් කාලයේදී නෙළුම් වනය හැකිලී යාම ලොව කවරකුට හෝ නැවැත්විය නොහැක්කාක් මෙන් සත්වයාට අසුබ කාලය පැමිණුන විට වැරදි වලට විපාක දීම කාට වැළැක්විය හැකිද?

### 36 වන පද්‍යය

**කරදර දුදන පිරිසිඳ දකුවද සතර**
**ගොරතර සපුන් විලසින් කට මිණි ලකර**
**නරවර සඳුන් තුර වළඳමිනි හැම වර**
**පරහට බියම මිස අමදෙකි කවරවර**

කුරුරි අසත්පුරුෂයෝ ශිල්ප ශාස්ත්‍ර කෙළවරටම දැන සිටියත් කණ්ඨ මාණික්‍යයෙන් අලංකාර වූ දරුණු සර්පයන් මෙන් අනුන්ට බියම මිස කවර යහපතක් සළසත්ද?

### 38 වන පද්‍යය

**කුල සියදිවි පුරුදුව විසුවද නොමද**
**දුල ගුණ සුදනන්ගෙ නොදනිති දනෝ දද**
**විල වැඩි මැඬිනු නොදනිති පියුමෙහි සුවඳ**
**වල බිඟු එමුවරද ගෙන මත්ව දෙති නද**

බොහෝ සෙමින් ඇසුරු කළත් මෝඩ මිනිස්සු සත්පුරුෂයන්ගේ උසස් ගුණ නොහඳුණති. විලෙහි වැඩුණු මැඩියෝ නෙලුම් මලෙහි සුවඳ නොදනිති. එහෙත් වනයෙහි වසන මීමැස්සෝ ඒ මල් උරා බී මත්ව ගුමු නද දෙති.

**මතු සම්බන්ධයි**



**විජේරත්න පතිරාජ**
බාහිර කථිකාචාර්ය
ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්ව විද්‍යාලය




## ප්‍රහේලිකාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 ආ | 2 | 3 | 4 | | 5 දා | 6 | ■ |
| 7 | | | | ■ | 8 | | 9 සා |
| | ■ | ග | ■ | 10 අ | | | |
| 11 වි | | | | | ■ | | ■ |
| | ■ | | ■ | 12 | 13 ස | | ■ |
| | ■ | | ■ | 14 න | | ■ | 15 |
| 16 | 17 ද | | ■ | 18 | | 19 | ව |
| ■ | | ■ | 20 සු | | ■ | 21 | |

**හරහට**

1 මේඝ ලතා, විජ්ජු ලතා මෙහි විසුවාලු
2 මුදුන
8 ජීවත් වීමට අත්‍යාවශ්‍යය
10 "මුදල් ලබා ගෙන" යන්න මෙලෙසින් ද කියයි.
11 තුන්ඈඳුනු නවකතා පෙලක මුල් පියවරකි
12 දඩුවම් දීමට අතට ගනී
14 මිනිස්
16 එක්තරා ශාරීරික විකෘතියකි
18 දුක්වීම/ශෝකීවීම
20 දෙවි
21 යුධ

**පහලට**

1 සර්පයකු
2 අප රට හැඳින්වෙන නාමයකි
3 සත්‍යවෝද්‍යානය පිහිටියේ මෙහිය
4 යමකින් සාදන ලද යන්න පැවසීමට යොදන වදනකි
5 සීමාවකි
6 හකුරු සැඟවීමට සුදුසු තැන
9 සරු...
10 ස්වර්ණාභරන මෙලෙස ද හැඳින්වේ
13 පිරිමි ඇඟලුමකි
15 කණ
17 සංඛ්‍යාත්මක අගයකි
19 මාර්ගය

## ජුනි කළාපයට අදාල ප්‍රහේලිකාවේ විසඳුම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ■ | 1 ප | 2 හ | 3 ව | ■ | 4 ම | ■ | ■ |
| 5 ප | ඬු | ව | ස් | 6 දෙ | වි | 7 ර | 8 ජ |
| ■ | 9 පු | ස් | ■ | නු | ■ | 10 ද | ල |
| 11 ක | ල් | ක | ■ | 12 ව | දු | ල | ක |
| ■ | ■ | 13 ල | 14 ක | ර | ■ | 15 යා | ර |
| 16 සු | 17 ක | ■ | 18 ස | ක | 19 ය | ■ | බෝ |
| 20 ජා | ත | ක | ක | ථා | ව | ■ | මි |
| 21 ත | ර | ■ | 22 රෑ | ව | ■ | 23 අ | බ |

**හරහට**

1. අඩුව නැතහොත් වියැකි
5. සුමිත්ත ගේ පුත්‍රයාය
9. දිලීර
10. ආසන්න හෙවත් මඳ
11. දේශීය වෙදකමේ ඖෂධ වර්ගයකි
12. කැලෑරොදක යන්න මෙසේ ද කිව හැක
13. ලස්සන
15. දිගමැනීමේ ඒකකයකි
16. සතුටු සැප
18. රෝදය
20. සාහිත්‍යාංගයකි
21. මහත
22. හඳුනාගැනීමේ ප්‍රහලම සලකුණයි
23. රසකාරකයකි

**පහලට**

1. සක්දෙවිඳුන් ගේ අසුන
2. සැන්දෑව
3. මේවා වදිනවට කිසිවෙකු කැමති නැත
4. පූජනීය කාණ්තාවකි
6. විශ්ව සාහිත්‍ය කෘතියක සිංහල පරිවර්තනය යි
7. වැඩවසම් යුගයේ ප්‍රභලයෙකි
8. ලෝක ඉතිහාසය වෙනස් කල නිපැයුමකි
14. එක්තරා සන්නිවේදකයෙකි
16. මනා ලෙස ජනිත වූ
17. කාන්තාරය
19. දුෂ්කර ආහාරයක් ලෙස සැලකේ

RESIDENTIAL DESIGNS, PERMITS DRAWINGS
RANJ DESIGN & DRAFTING SERVICES
RANJITH WANNINAYAKE

- FREE ADVICES
- PLANS–SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS

REGISTERED Building Practitioner
bdav

3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrake@gmail.com